# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,139 - 2019 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2019.08.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1506 | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1522 |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1512 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 1523 |


*සැ. යු.*-(i) මුදල් පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 සැප්තැම්බර් මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 සැප්තැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

**මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) තනතුරුවල පවතින පුරප්පාඩු වෙනුවෙන් III ශ්‍රේණිය සඳහා විවෘත බඳවා ගැනීම**

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා විවෘත බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පුරප්පාඩු තනතුරු* :

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| සෞඛ්‍ය කම්කරු | 05 |
| පුස්තකාල සේවක | 01 |

සේවා ගණය :- ප්‍රාථමික (ශිල්පීය නොවන)

බඳවා ගන්නා ශ්‍රේණිය :- 111

*තනතුරේ ස්වභාවය* :- මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් පිළිබඳව රජය විසින් කලින් කලට පනවනු ලබන නියමයන්ට යටත් වේ.

*වැටුප් ක්‍රමය* :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි PL 01 - 2016 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෙම තනතුරු සඳහා හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 24,250-10x250-10x270-10x300-12x330 - රු.36,410
(ඉහත චක්‍රලේඛයෙහි උපලේඛන 11 අනුව 2019.01.01 වැනි දිනට වැටුප රු.21,746/- කි. මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි ඉදිරි වැටුප් ගෙවීම් සිදුකරනු ලබයි.)

*අධ්‍යාපන සුදුසුකම්* :- අ.පො.ස.(සා/පෙ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු අතර, මින් විෂයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

*සැ.යු.*- මෙම සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීමේ දී ඉහත සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති වුවහොත්, අධ්‍යාපන සුදුසුකම් 5 ශ්‍රේණිය සමත් වීම දක්වා අඩුකර බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

*කායික සුදුසුකම්* :- සෑම අපේක්ෂකයකුම මනා ඇස් පෙනීමකින් හා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වූවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

02. *වෙනත් සුදුසුකම්* :-

I. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචියක් තිබිය යුතුය. අයදුම්පත් අනුව බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබීම මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් එහිදී ඡන්දහිමි නාම ලේඛනය මඟින් පදිංචිය සනාථ කළ යුතුය;

II. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය;

III. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු ම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය;

IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතුය;

V. රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.

03. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය. මෙම සභාවේ සේවයේ යෙදී සිටින ස්ථිර තනතුරු දරන අය සම්බන්ධව උපරිම වයස් සීමා බලපානු නොලැබේ.

04. *බඳවා ගැනීමේ පිළිවෙල :*

I. බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති සියලු අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර අවශ්‍ය සියලු සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට බඳවා ගනීම සිදු කරනු ලබේ.

II. පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ දී සභාවේ දැනටමත් සේවයේ නියුතු සේවකයන් සඳහා බඳවා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

05. *සේවා කොන්දේසි :*

I. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය;

II. පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළ හොත් පත්වීම් ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.

III. අදාළ පත්වීම් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත් වේ.

IV. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග මධ්‍යම පළාත් සභාව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා මැදදුම්බර ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කනරන නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

V. පත්වීම ලබා මාසයක් ඇතුළත නියමිත සුදුසකම් ඇති වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

06. *අයදුම් කිරීමේ අනුපිළිවෙල :-*

I. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආකෘතිය අනුව පමණක් සකස් කළ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කොට 2019.09.23 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, මැදදුම්බර ප්‍රාදේශීය සභාව, තෙල්දෙණිය." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

II. අයදුම්පතේ සඳහන් කරනු ලබන සුදුසුකම් සනාථ කිරීමට අදාළ ලියවිලිවල ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් එම අවස්ථාවේ මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

III. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ අසම්පූර්ණ හෝ මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳව මෙම ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

IV. තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම්, ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් සකස් කර ගත යුතු අතර, එකම කවරයක බහා එවීම ප්‍රමාණවත් වේ. එහිදී අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරු සියල්ලම සඳහන් කළ යුතුය.

07. *අයදුම්පත් පිරවීම සඳහා උපදෙස් :*

I. ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-9 දක්වා කරුණු ද, දෙවන පිටෙහි 10-14 දක්වා කරුණු ද, තුන්වන පිටෙහි ඉතිරි ඡේද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය.

II. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චකාරයකු, දිවුරුම් නොතාරිස්වරයකු, නීතිඥවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ රු. 240360/- කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

III. යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලිපිය ලැබීමට පෙර හෝ පත්වීම ලබාදීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

IV. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

08. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

සුමනා විජේරත්න,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 09 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,
තෙල්දෙණිය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ........................................................................... III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

අදාළ කොටුව තුළ " √ " ලකුණ යොදන්න.

01. (I) මුලකුරු සමග නම :________________________

(II) මුලකුරුවලින් හැඳින්වෙන නම් :________________________

02. පෞද්ගලික ලිපිනය :________________________

03. දුරකතන අංකය :________________________

04. උපන් දිනය : අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

05. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස : අවු. : ☐☐ මාස : ☐☐ දින : ☐☐

06. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? : ඔව් : ☐ නැත : ☐

එසේ නම් පරම්පරාවෙන් ද? ☐

ලියාපදිංචි වීමෙන් ද? ☐

08. ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

09. විවාහක / අවිවාහක බව : විවාහක : ☐ අවිවාහක : ☐

10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :________________________

11. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (ලබා ඇති විශිෂ්ට හෝ සම්මාන සාමාර්ථ අනුව විෂයයන් පිළිවෙලින් සඳහන් කරන්න.)

පෙනී සිටි වාරය : I
විභාග අංකය :―――――――
වර්ෂය :―――――――

| අනු. අංක | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

පෙනී සිටි වාරය : II
විභාග අංකය :―――――――.
වර්ෂය :―――――――

| අනු. අංක | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :-
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

13. වෙනත් සුදුසුකම් :-
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

14. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :-

(1) සේවයේ යෙදී සිටින තනතුර :- ..........................................................
(11) කවදා සිටද යන වග :- ..........................................................

15. මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු හෝ පත්වීමක් ලද පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

.................................... ....................................................
දිනය අයදුම්කරුගේ අත්සන.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ මයා/මිය/මෙය, මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

........................ ........................................................
දිනය සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම : .........................................................................
තනතුර :. ........................................................................
ලිපිනය : ..........................................................................................................
..........................................................................................................

16. *දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය :-*

මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන .................................................................මයා/ මිය/ මෙය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ / (ස්ථිර / අනියම් / ආදේශක / කොන්ත්‍රාත්) පදනම මත ............................................................................................. කු වශයෙන් සේවය කරයි. ඔහු /ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් නිදහස් කළ හැක / නොහැක. ඔහු / ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

.......................... ...................................................................... ,

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන.

සම්පූර්ණ නම - .....................................................................................

තනතුර - .....................................................................................

නිල මුද්‍රාව - .....................................................................................

08-1030

---

සංශෝධනයයි

**පානදුර ප්‍රාදේශීය සභාව**

2019.08.02 දින පළ කරන ලද අංක 2135 දරන *ගැසට්* පත්‍රයේ නිවේදන අංක 08-121 යටතේ අනු. අංක 08 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* | *වැටුප් පරිමාණය* | *බඳවා ගැනීමේ ක්‍රමවේදය* |
|---|---|---|---|---|---|
| 08 | නගර ශාලා භාරකරු III | 01 | දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම. මින් විෂයයන් (5) ක් එකවර සමත් වී තිබිය යුතුය. | රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 330 - 12 x 330 රු. 36,410.00 (PL 1-2016) | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය |

අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 2019.09.06 දක්වා දීර්ඝ කරනු ලැබේ.

ලේකම්,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

08-1075

## හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

2019.08.23 වැනි දින පළ කරන ලද අංක 2,138 දරන *ගැසට්* පත්‍රයේ නිවේදන අංක 08-950 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇති හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුලින් ප්‍රමාණවත් අයදුම්කරුවන් නොමැත්තේ නම්, යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අයදුම්කරුවන්ගේ අයදුම්පත් පිළිබඳව ද සලකා බලනු ලැබේ.

*ඉහත තනතුර සඳහා අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

2. අයදුම්කරු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. (අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළින් ප්‍රමාණවත් අයදුම්කරුවන් නොමැත්තේ නම්, යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අයදුම්කරුවන්ගේ අයදුම්පත් පිළිබඳවද සලකා බලනු ලැබේ.)

සී. පී. නවරත්න,
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

තිත්තපජ්ජල-වැරැල්ලගම.

08-1116

---

සංශෝධනයයි

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

2019.08.23 වැනි දින පළ කරන ලද අංක 2,138 දරන *ගැසට්* පත්‍රයේ විදුලි කාර්මික III වන ශ්‍රේණිය හා කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා පළ කරන ලද දැන්වීම අනුව අයදුම්පත් භාර ගැනීමේ දිනය 2019.09.09 වැනි දින දක්වා දීර්ඝ කරන ලදී.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2019 අගෝස්තු මස 30 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

08-1117

# පළාත් පාලන නිවේදන

## අරණායක ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG/LG-5/5/1/19-1 අංක දරන 2019.05.28 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග අරණායක ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සලකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශ්වයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස තුනක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනවිරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2019 අගෝස්තු මස 13 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

උපලේඛනය

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | හකුරුගම්මන පින්වත්ත කෙරමිණිය මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | හොරේවල හෙම්මාතගම පළාත් සභා මාර්ගය |
| මාර්ගයේ අවසානය | : | කේ. එච්. රණතුංග මහතා හිමිකම් කියන කෙරමිණියවත්ත ඉඩම |
| ග්‍රාම නිලධාරි වසම | : | 42 හකුරුගම්මන වසම |
| මාර්ගයේ දිග හා පළල | : | දිග - මීටර් 220 පළල - අඩි 08 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් :*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | කේ. එච්. නිශාන්ත කුමාර කෙරමිණිය මයා | හෝම්පොලහේන |
| 02. | සී. එස්. බී. රත්නායක මයා | හෝම්පොලහේන |
| 03. | ඩී. ආර්. නිමල්සිරි බණ්ඩාර මයා | දිද්දෙණියේවත්ත |

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | එම්. ගුණතිලක මයා | බෙරවාදෙණිය |
| 02. | ජී. ආර්. උපුල් රංජිත් අතාවුද මයා | ගොඩමඩිත්තේහේන *නොහොත්* හිටිනාවත්ත |
| 03. | ජේ. එම්.සුමනාවතී මිය | හෙනගහච්චිවත්ත |
| 04. | එම්. පේමා චන්ද්‍රාවතී මිය | හෙනගහච්චිවත්ත |


බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2019.03.02 දින මනින ලද පිඹුරුපත් අංක 396/2019 දරන පිඹුරුපත අනුව වේ.

එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලම්තිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.

පිඹුරු අංකය: 396/2019

## හකුරුගම්මන පින්වත්ත කෙරම්ණිය මාර්ගය

පරිමාණය 1:1000




සබරගමුව පළාතේ

කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බඩ කෝරළේ, තුන්පළාත පත්තුවේ උඩ හකුරුගම්මන ගමේ පිහිටි බෙරවාදෙනිය, හෝම්පොලහේන, ගොඩමඩිත්තහේන නොහොත් හිටිනාවත්ත, දිද්දෙණියේවත්ත, හෙනගහවිච්චත්ත සහ කෙරම්ණියවත්ත හරහා පවතින මාර්ගය මැන සාදන ලද

-පිඹුර-

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර | අ | රූ | පර | | | |
| 1 | 0.0655 | 00 | 0 | 25.90 | 220.00 | 08 | මාර්ගයේ අවම පළල අඩි 08 ක් වන අතර සෙසු ස්ථාන වල පළල අඩි 08 ට වැඩිවේ |

2019-05-23
එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලම්තිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ටෙලි : 035-2266422/077 4973610
ලි.ප. අංකය: 19831492

මනින ලද්දේ : 2019.03.02 වන දින

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | හබලක්කාව අමුහේනවත්ත මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | දූල්දෙණිය සිට පල්කුඹුර දක්වා ප්‍රාදේශීය සභා මාර්ගය |
| මාර්ගයේ අවසානය | : | අමුහේනවත්ත ඉඩම |
| ග්‍රාම නිලධාරි වසම | : | හබලක්කාව |
| මාර්ගයේ දිග හා පළල | : | දිග - මීටර් 58 පළල - අඩි 10 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් :*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | ජී. ජී. සී. ඩී. විමලරත්න මයා<br>එස්. ඒ. චානක විමුක්ති උපතිස්ස මයා සහ<br>ජී. ජී. නුවන් කෝසල හේමචන්ද්‍ර | අමුහේනවත්ත |

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | එම්. ආර්. එම්. නිසාර් මයා | දේවපේඩිගේහේන |
| 02. | ජී. ජී. සී. ඩී. විමලරත්න මයා<br>එස්. ඒ. චානක විමුක්ති උපතිස්ස මයා සහ<br>ජී. ජී. නුවන් කෝසල හේමචන්ද්‍ර | අමුහේනවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2019.03.02 දින මනින ලද පිඹුරුපත් අංක 395/2019 දරන පිඹුරුපත අනුව වේ.


එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලම්තිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.

පිඹුරු අංකය: 395/2019

# හබලක්කාව අමුහේනවත්ත මාර්ගය

පරිමාණය 1:1000

විස්තරය
ඉ - ඉවුර
පැවැ - පැලෙඟි වැට
අවි - අවිනිශ්චිත
ආතා - ආධාරක තාප්පය
මාර්ග(ප්‍රාස් - මාර්ග(ප්‍රාදේශීය සභා)




## සබරගමුව පළාතේ

## කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බඩ කෝරළේ, තුන්පළාත පත්තුවේ

හබලක්කාව ගමේ පිහිටි දේවපේඩිගේහේන සහ අමුහේනවත්ත හරහා පවතින මාර්ගය මැන සාදන ලද

-පිඹුර-

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | | |
| 1 | 0.0263 | 00 | 0 | 10.40 | 58.0 | 10 | |

2019.05.23
එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලම්තිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
දුරකථන : 035-2266422/077 4973610
ලි.ප. අංකය: 19831492

මනින ලද්දේ : 2019.03.02 වන දින

සත්‍ය පිටපතක් බව සහතික කරමි

ලේකම්
අරණායක ප්‍රාදේශීය සභාව

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | මහවෙල මාර්ගයේ පාලම අසල බණගලපිටිය වත්තේ සිට අගලවත්ත දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | එන්. ඩී. රොෂානි චන්දිමා ගුණතිලක මහත්මිය හිමිකම් කියන බණගල පිටිය ඉඩම |
| මාර්ගයේ අවසානය | : | ඩබ්ලිව්. පී. සිරිල් වික්‍රමසිංහ මහතා හිමිකම් කියන වික්‍රමපේඩිගේ වත්ත ඉඩම |
| ග්‍රාම නිලධාරි වසම | : | 47 බී දෙබත්ගම උඩබාගේ |
| මාර්ගයේ දිග හා පළල | : | දිග - මීටර් 120 පළල - අඩි 08 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් :*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | එන්. ඩී. රොෂානි චන්දිමා ගුණතිලක මිය | බණගලපිටිය |
| 02. | එච්. පී. හේමසිරි ධර්මවර්ධන අගලවත්ත මයා | බණගලපිටිය |
| 03. | ඩබ්ලිව්. පී. ගාමිණී වික්‍රමසිංහ මයා | හඹුරුවෙල වත්ත |
| 04. | ඩබ්ලිව්. පී. සිරිල් වික්‍රමසිංහ මයා | වික්‍රමපේඩිගේ වත්ත |

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | එන්. ඩී. රොෂානි චන්දිමා ගුණතිලක මිය | බණගලපිටිය |
| 02. | පී. කේ. දෙලංකාවල මයා | කලවිටේගෙදරවත්ත (බස්නාහිර මායිමට පිටතින් මාර්ගය ගමන් කරන බැවින් මෙම ඉඩමේ කොටස් මාර්ගයට අයත්ව නැත.) |
| 03. | ඩබ්ලිව්. පී. සිරිල් වික්‍රමසිංහ මයා | වික්‍රමප්ඩිගේ වත්ත |


බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2019.02.02 දින මනින ලද පිඹුරුපත් අංක 394/2019 දරන පිඹුරුපත අනුව වේ.

එච්.එම්.ආර්.පී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලමිතිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.

පිඹුරු අංකය: 394/2019

## මහවෙල මාර්ගයේ පාලම අසල බනගලපිටිය වත්තේ සිට අගලවත්ත දක්වා මාර්ගය

පරිමාණය 1:1000




සබරගමුව පළාතේ

කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බඩ කෝරළේ තුන්පළාත පත්තුවේ
දෙබත්ගම උඩබාගේ ගමේ පිහිටි
උඩහබණගලපිටියේ වත්ත සහ වික්‍රමපේඩිගේ වත්ත
යන ඉඩම් හරහා පවතින මාර්ගය මැන සදන ලද

-පිඹුර-

සත්‍ය පිටපතක් බව සහතික කරමි

Dad
.........................................
ලේකම්
අරණායක ප්‍රාදේශීය සභාව

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර | | | |
| 1 | 0.0316 | 0 | 0 | 12.49 | 120.00 | 8 | |

2019-05-23
එච්.එම්.ආර්.පී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
දුරකථන : 035-2266422/077 4973610

මනින ලද්දේ : 2019.02.02 වන දින

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | රත්දිලිගම පීල්ලදෙණිය මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | සැලව මැදිලිය මංසන්ධිය |
| මාර්ගයේ අවසානය | : | පරගහපීල්ල මාර්ගයේ ආරම්භයේ |
| ග්‍රාම නිලධාරි වසම | : | 14 බී යෝධගම වසම |
| මාර්ගයේ දිග හා පළල | : | දිග - මීටර් 410 පළල - අඩි 08 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් :*

01. ඇළ මාර්ගය

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | පී. ආර්. නිල්මිණී කුමාරි මිය<br>එස්. එම්. කරුණාතිලක මයා සහ<br>එස්. එම්. ඉන්ද්‍රාවතී සමරකෝන් මිය | එරබද්ද කුඹුර |
| 02. | පී. ආර්. නිල්මිණී කුමාරි මිය | දිඹුල්උල්ල කුඹුර |
| 03. | එච්. ජී. නිකුලස් ස්වාමී මයා | දිඹුල්උල්ල කුඹුර |
| 04. | ආර්. ජී. නිමල් කරුණාරත්න මයා | දිඹුල්උල්ල කුඹුර |
| 05. | යූ. ආර්. බන්දුල සෙනරත් මයා | දිඹුල්උල්ල කුඹුර |
| 06. | පී. ආර්. පුංචිබණ්ඩා මයා<br>යූ. ආර්. හරිස්චන්ද්‍ර මයා සහ<br>යූ. ආර්. උපුල් පුෂ්පකුමාර මයා | පීල්ලදෙණිය කුඹුර |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2018.11.22 දින මනින ලද පිඹුරුපත් අංක 366/2019 දරන පිඹුරුපත අනුව වේ.


එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලමිතිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.
ලියාපදිංචි අංකය: 19831492

# රන්දිලිගම පිල්ලදෙනිය මාර්ගය

පිඹුරු අංකය: 366/2019

පරිමාණය 1:1000

යොමුව :- අරණායක ප්‍රාදේශීය සභා සභාපතිගේ අංක අර/ප්‍රාස/07/මාර්ග මැනුම් හා 2006.10.04 දින ලිපිය




## සබරගමුව පළාතේ

## කෑගල්ල දිස්ත්‍රික්කයේ

පරණකුරු කෝරළේ තුන්පළාත පත්තුවේ රන්දිලිගම ගමේ පිහිටි එරබද්ද කුඹුර, දිඹුල්උල්ල කුඹුර, පිල්ලදෙනිය කුඹුර සහ හිටිනාවත්ත නැමති ඉඩම හරහා පවතින මාර්ගය මැන සාදන ලද

-පිඹුර-

විස්තරය

පැවැ - පැලඉති වැට

ඉ - ඉවුර

මාර්ග(ප්‍රාස) - මාර්ගය(ප්‍රාදේශීය සභා)

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර | | | |
| 1 | 0.1496 | 00 | 1 | 19.15 | 410.00 | 8 | පවතින මායිම් අනුව මනින ලදී |

මනින ලද්දේ : 2018.11.22 වන දින

මායිම් පෙන්වා දුන් අය } ඉඩම් හිමිකරුවන්
මායිම් බලා ගත් අය }

සත්‍ය පිටපතක් බව සහතික කරමි

ලේකම්
අරණායක ප්‍රාදේශීය සභාව

2019-03-31
එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ටෙලි : 035-2266422/077 4973610
ලි.ප. අංකය: 19831492

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | රන්දිලිගම කොටුවවත්ත මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | රන්දිලිගම සැලව ප්‍රාදේශීය සභා මාර්ගය |
| මාර්ගයේ අවසානය | : | ආර්. එම්. මුතුබණ්ඩා මහතා හිමිකම් කියන බෝධිකොටුව ඉඩම |
| ග්‍රාම නිලධාරි වසම | : | 14 බී යෝධගම වසම |
| මාර්ගයේ දිග හා පළල | : | දිග - මීටර් 126 පළල - අඩි 08 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් :*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | පී. ආර්. ටිකිරි බණ්ඩාර මයා | කොටුවෙවත්ත |
| 02. | ආර්. එම්. මහින්ද රත්නායක මයා | කොටුවෙවත්ත |
| 03. | ආර්. එම්. මුතුබණ්ඩා මයා | බෝධිකොටුව |

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01. | ජී. ආර්. අනුලාවතී මිය | අස්වැද්දුමේ වත්ත |
| 02. | පී. කේ. සුනිල් බණ්ඩාර මයා | අස්වැද්දුමේ වත්ත |
| 03. | ජී. ජී. හේමාවතී මැණිකේ මිය | අස්වැද්දුමේ වත්ත |
| 04. | ආර්. එම්. මහින්ද රත්නායක මයා | කොටුවෙවත්ත |
| 05. | ආර්. එම්. ගාමිණී රත්නායක මයා | හිටිනාවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2018.11.22 දින මනින ලද පිඹුරුපත් අංක 339/2019 දරන පිඹුරුපත අනුව වේ.


එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු හමිතිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.
ලියාපදිංචි අංකය: 19831492

යොමුව :- අරණායක ප්‍රාදේශීය සභා සභාපතිගේ අංක අර/ප්‍රාස/07/මාර්ග මැනුම් හා 2006.10.04 දින ලිපිය

# රන්දිලිගම කොටුවවත්ත මාර්ගය

පිඹුරු අංකය: 339/2019

පරිමාණය 1:1000




විස්තරය
පැවැ - පැළඉති වැට
ආතා - ආධාරක තාප්පය
ඉ - ඉවුර
මාර්ග(ප්‍රාස) - මාර්ගය(ප්‍රාදේශීය සභා)

## සබරගමුව පළාතේ
## කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බොඩ කෝරළේ තුන්පළාත පත්තුවේ රන්දිලිගම ගමේ පිහිටි ඉලුක්හෙදරවත්ත, කොටුවෙවත්ත, හිටිනාවත්ත සහ බෝධිකොටුව නැමති ඉඩම හරහා පවතින මාර්ගය මැන සාදන ලද

-පිඹුර-

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර | | | |
| 1 | 0.0356 | 00 | 0 | 14.07 | 126.00 | 8 | පවතින මායිම් අනුව මනින ලදී |

මනින ලද්දේ : 2018.11.22 වන දින

මායිම් පෙන්වා දුන් අය } ඉඩම් හිමිකරුවන්
මායිම් බලා ගත් අය

සත්‍ය පිටපතක් බව සහතික කරමි.

Pay
ලේකම්
අරණායක ප්‍රාදේශීය සභාව

2019-03-07
එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු හෑමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ටෙලි : 035-2266422/077 4973610
ලි.ප. අංකය: 19831492

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

### පුත්තලම නගර සභාව

නගර සභා පනතින් සහ ඒ යටතේ 1939 ජුනි 16 වැනි දින හා 8458 අංක දරන *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කරන ලද නගර සභා සම්බන්ධයෙන් වලංගුව පවත්නා මූල්‍ය රීති මාලාවේ 202 වන රීතියේ සඳහන් විධිවිධානවලට අනුකූලවන පරිදි පහත උපලේඛනවල සඳහන් පුත්තලම නගර සභාවේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය සහ 2018.12.31 වැනි දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. බායිස්,
සභාපති,
පුත්තලම නගර සභාව.

2019 අගෝස්තු මස 09 වැනි දින,
පුත්තලම නගර සභාවේදී ය.

**පුත්තලම නගර සභාව**

***2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය***

| *විස්තරය* | *2018.12.31* | *2017.12.31* |
|---|---|---|
| මෙහෙයුම් ආදායම<br>රජයේ දායකය | 81,210,817.83 | 85,171,068.89 |
| පුනරාවර්තන ආදායම | 88,409,652.31 | 91,686,741.97 |
| මුළු මෙහෙයුම් ආදායම | 169,620,470.14 | 176,857,810.86 |
| මෙහෙයුම් වියදම්<br>පුනරාවර්තන වියදම් | 129,407,219.23 | 109,635,949.25 |
| මුළු මෙහෙයුම් වියදම | 129,407,219.23 | 109,635,949.25 |
| වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය | 40,213,250.91 | 67,221,861.61 |
| ප්‍රාග්ධන ලැබීම්<br>ප්‍රාග්ධන වියදම් | 4,439,233.71<br>27,693,598.37 | 12,881,568.68<br>33,274,905.84 |
| වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය | 16,958,886.25 | 46,828,524.45 |

උපලේඛන II

***පුත්තලම නගර සභාව***

*2018.12.31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය*

| *විස්තරය* | *2018.12.31* | *2017.12.31* |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්)<br>දේපළ පිරියත හා උපකරණ | 97,990,638.63 | 92,859,282.09 |
| ජංගම වත්කම් | | |
| අතැති තොගය | 15,968,321.94 | 9,663,683.48 |
| සේවක ණය | 4,683,651.67 | 4.438,999.76 |
| ලැබිය යුතු දෑ (අයකර ගත හැකි) | 12,813,361.27 | - |

| *විස්තරය* | *2018.12.31* | *2017.12.31* |
|---|---|---|
| ආදායම් ණයගැති | 215,049,746.65 | 245,999,175.55 |
| ඉදිරියට ගෙවීම් | 57,621,738.84 | 53,870,548.51 |
| ආයෝජන | 741,570.88 | 719,828.31 |
| මුදල් හා මුදල් සමාන දෑ | 4,904,278.24 | 7,920,334.91 |
| මුළු වත්කම් | 409,773,308.12 | 415,471,852.61 |
| හිමිකම් | 315,278,397.46 | 287,737,313.97 |
| ජංගම නොවන වගකීම් | 16,050,829.28 | 17,484,878.03 |
| ජංගම වගකීම් | 78,444,081.38 | 110,249,660.61 |
| මුළු හිමිකම් හා වගකීම් | 409,773,308.12 | 415,471,852.61 |

08-998

# විවිධ දැන්වීම්

## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

### විවිධ ගාස්තු පැනවීම 2019 ඇසළ පෙරහැර විශේෂ පොළ

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රාකාරව 2019 හඟුරන්කෙත ඇසළ පෙරහැර සමයේ විවිධ ගාස්තු අයකිරීම පිළිබඳ 2019 ජූලි මස 12 වැනි දින මුදල් කාරක සභාවේ 06-13 කරුනෙන් නිර්දේශ කරන ලද ගාස්තු අය කිරීමට 2019 ජූලි 30 වැනි දින පැවති මහා සභාවේදී තීරණ අංක 06-13 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. ටී. ජී. රණසිංහ බණ්ඩා.
සභාපති.
හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව.

06-13, 2019 හඟුරන්කෙත ඇසළ පෙරහැර සමයේ ඉදිකරන ලද තාවකාලික වෙළඳසැල්වලින් බලපත්‍ර ගාස්තු හා අනෙකුත් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව පහත සඳහන් පරිදි තාවකාලික අවසරපත්‍ර ගාස්තු හා අනෙකුත් ගාස්තු අය කිරීම පිළිබඳව කාරක සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡා කර පහත පරිදි ගාස්තු අය කිරීම සුදුසු බව නිර්දේශ කරන ලදි. මුදල් කාරක සභා නිර්දේශය පිළිගැනීමට මහ සභාව තීරණය කරන ලදි.

| | *ආදායම් වර්ගය* | *ව. අ. 15-30* | *ව. අ. 30-75* | *ව. අ. 75-125* |
|---|---|---|---|---|
| 01. | ලී බඩු වෙළඳාම | 1100.00 | 1400.00 | 2000.00 |
| 02. | ඇල්මිනියම් භාණ්ඩ වෙළඳාම | 800.00 | 1300.00 | 1500.00 |
| 03. | ප්ලාස්ටික් භාණ්ඩ වෙළඳාම | 700.00 | 1100.00 | 1400.00 |
| 04. | රෙදි වෙළඳාම | 800.00 | 1000.00 | 1400.00 |
| 05. | පිත්තල බඩු වෙළඳාම | 800.00 | 1100.00 | 1400.00 |
| 06. | තේ කඩ | 800.00 | 900.00 | 1400.00 |
| 07. | රසකැවිලි වෙළඳාම | 700.00 | 850.00 | 1000.00 |
| 08. | පැදුරු වෙළඳාම | 600.00 | 900.00 | 1000.00 |
| 09. | නිමි රෙදි වෙළඳාම | 800.00 | 1000.00 | 1400.00 |
| 10. | සුවඳ විලවුන් හා විසිතුරු භාණ්ඩ වෙළඳාම | 700.00 | 750.00 | 1200.00 |
| 11. | වීදුරු භාණ්ඩ වෙළඳාම | 600.00 | 700.00 | 1000.00 |

| | *ආදායම් වර්ගය* | *ව. අ. 15-30* | *ව. අ. 3-75* | *ව. අ. 75-125* |
|---|---|---|---|---|
| 12. | අයිස්ක්‍රීම් වෙළඳාම | - | 1000.00 | 1500.00 |
| 13. | සපත්තු භාණ්ඩ වෙළඳාම | 700.00 | 1000.00 | 1300.00 |
| 14. | ලොතරැයි කුටි සඳහා | 700.00 | 1000.00 | 1300.00 |
| 15. | වීදුරු උපකරණ | 800.00 | 1000.00 | 1500.00 |
| 16. | වානේ භාණ්ඩ සඳහා | 800.00 | 1900.00 | 2000.00 |
| 17. | ගමන් බෑග් වෙළඳාම | 750.00 | 900.00 | 1200.00 |
| 18. | විසිතුරු මල් අලෙවිය | 700.00 | 800.00 | 1200.00 |
| 19. | පරිගණක ආශ්‍රයෙන් තොරතුරු ලබාගැනීම | 700.00 | 800.00 | 1000.00 |
| 20. | ජංගම දුරකතන වෙළඳකුටි | 1000.00 | 1200.00 | 1400.00 |
| 21. | වීසීඩී/ඩීවීඩී කැසට්පට අලෙවිය | 700.00 | 1000.00 | 1300.00 |
| 22. | හිස්වැසුම් අලෙවිය | 600.00 | 800.00 | 1000.00 |
| 23. | සිසිල් බීම අලෙවිය | 700.00 | 900.00 | 1300.00 |
| 24. | සංචාරක වෙළඳාම | - | - | 5000.00 |
| 25. | තාවකාලික විනෝද මේලා බලපත්‍ර ගාස්තු | - | - | 1500.00 |
| 26. | විදුලි උපකරණ අලෙවිය | 1000.00 | 1500.00 | 2000.00 |
| 27. | විනෝද ක්‍රීඩා | 800.00 | 1000.00 | 1500.00 |

ඉහත සඳහන් වෙළඳ ආයතනවලින් ගාස්තු අය කිරීමේදී වර්ග අඩි 125 ට වැඩි වන සෑම වර්ග අඩියකටම රු. 10ක ගාස්තුවක් අය කිරීම.

- ඇසළ පෙරහැර කාලසීමාව තුළ ජංගම දුරකතන අලෙවිය හා සිම් කාඩ් අලෙවිය සඳහා ස්ථානයක් පවත්වාගෙන යන වෙළඳ හිමියන් විසින් වෙනම ස්ථානයක් පවත්වාගෙන යන්නේ නම් රුපියල් 1900.00 ක මුදලක් ද එසේ නොමැතිව වෙනම ආයතනයක් විසින් වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යන්නේ නම් රුපියල් 2500.00 ගාස්තුවක්;
- හිසින් හා අතින් වෙළඳාම් කරන හා ජංගම කරත්ත මඟින් වෙළඳාම් කරන සංචාරක වෙළඳුන්ගෙන් රුපියල් 500 ක අවසර පත්‍ර ගාස්තුවක්;
- සැණකෙළි හා ප්‍රවේශපත්‍ර ගාස්තුවෙන් 15% ක්;
- විනෝද බදු අයකිරීමේදී විනෝද බදු ආඥපනතේ කොන්දේසි ඒ අයුරින් ක්‍රියාත්මක වන අතර, විනෝද සැණකෙළිවලින් 15% ක විනෝද බද්දක්;
- තාවකාලික ගොඩනැගිලි ඉදිකිරීම් අයදුම්පත්‍ර ගාස්තු රු. 500.00 ක්;
- නවතා තබා ඇති වාහනයකින් වෙළඳාම් කරන වර්ග අඩියකින් රු. 200.00;
- පෙරහැර කාලය තුළ තාවකාලික අවසරපතක් නොමැතිව ව්‍යාපාර කටයුතු කරන සියලුම ව්‍යාපාරික යන්ගෙන් නීත්‍යානුකූල කටයුතු කර දඩයක් සමඟ අය විය යුතු මුදල් අය කර ගැනීම;
- ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කුලියට දීමේදී වර්ග අඩියක් රු. 180.00 සිට 200.00 දක්වා මිලකට ලබා දීම;
    - පෙරහැර ප්‍රචාරන සේවාවන් සඳහා ටෙන්ඩර් කිරීම මඟින් කටයුතු කිරීමටත් රු. 200,000.00 (ලක්ෂ දෙකක්) අවම ලංසුවක් මත ටෙන්ඩර් කිරීමට කාරක සභාව නිර්දේශ කරන ලද අතර , අසාදු ලේඛන ගත කර ඇති ටෙන්ඩර්කරුවන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලෙස පෙන්වා දෙන ලදි.;
    - හඟුරන්කෙත බාලිකා ක්‍රීඩාපිටිය රථගාල පවත්වාගෙන යාම සඳහා රු. 20,000.00 ක අවම ලංසුවක් හා ;
    - දියතිලක මහා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය රථගාල පවත්වාගෙන යාම සඳහා රු. 5000.00 ක අවම ලංසුවක් මත ලබා දීමටත්.

තීරණ අංක 06-13 මුදල් කාරක සභාවේ නිර්දේශය පිළිගැනීමට මහා සභාව තීරණය කරන ලදී.

08-1104

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.